# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

අංක 14,869 — 1969 අගෝස්තු 29 වැනි සිකුරාද — 1969.8.29

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදී)


# II වැනි කොටස–අධිකරණ

(වෙන වෙනම ගොනුකරගත හැකි පරිදි සෑම කොටසකටම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොද ඇත.)


| | පිට | | පිට |
|---|---|---|---|
| සම්මත වූ පනත් .. .. .. | — | පිස්කල් විකිණීම පිළිබඳ දන්වීම .. .. | 111 |
| ශ්‍රෙෂ්ඨාධිකරණයේ දන්වීම .. .. .. | — | මුදල් නඩු පිළිබඳ දන්වීම .. .. .. | — |
| ශ්‍රෙෂ්ඨාධිකරණයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන .. | 111 | නීති අධ්‍යාපන සභාවේ දන්වීම .. .. .. | — |
| දිස්ත්‍රික් උසාවිවල හා ඊට පහළ උසාවිවල දන්වීම .. | — | නොතාරිස් ලැයිස්තුව .. .. .. | — |
| වස්තු භංගත්ව නඩු පිළිබඳ දන්වීම .. .. | — | විවිධ දන්වීම .. .. .. | — |
| පිස්කල් මාර්ෂල්වරුන් පත් කිරීම .. .. | — | | |


## ශ්‍රෙෂ්ඨාධිකරනයේ අපරාධ නඩු සැසි පිළිබඳ නිවේදන

### ප්‍රකාශනයයි

ශ්‍රී ලංකාද්වීපයේ ගරු ශ්‍රෙෂ්ඨාධිකරණයෙන් මට ලැබී තිබෙන අධිකරණ විධානයක බලය පිට දකුණු දිසාව සඳහා එකී අධිකරණයේ අපරාධ නඩු වාරයක් වර්ෂ 1969 ක්වූ සැප්තැම්බර් මස 15 වන දින පෙරවරු 11 ට ගාල්ලේ අධිකරණ ශාලාවේදී පවත්වන්නට යෙදෙන බව මම මෙයින් ප්‍රකාශ කර සිටිමි.

තව ද, ඉහත කී වේලාවට එකී ස්ථානයට පැමිණ සිටින ලෙසත්, අවසර ඉල්ලා ලබාගෙන මිස එතැනින් පිටවී නොයන ලෙසත්, මේ නඩු වාරය හා සම්බන්ධකමක් ඇති සියලු දෙනාටම මම මෙයින් නියමකොට දැනුම් දෙමි.

පී. ජේ. ටී. ගුණසිංහ,
දකුණු පලාතේ පිස්කල්.

1969 ක්වූ අගෝස්තු මස 17 වන දින,
ගාල්ලේ පිස්කල් කන්තෝරුවේදීය.

8–1295

## පිස්කල් විකිණීම් පිළිබඳ දන්වීම්

### ඌව පළාත

### බදුල්ලේ දිස්ත්‍රික් උසාවියේදීය

විල්සන් සෙනරත් යාපා, පාලාගොල්ල, පස්සර, දූනට, ඇලිමොලේ ........................................................................ පැමිණිලිකාරයා.

අංක : එම්බී/5543. එදිරිව

ඩබ්ලිව්. රෝස්ලින් කරුණාරත්න, පස්සර නගරය, පස්සර........................................................................ විත්තිකාරයා.

මෙහි පහත සඳහන්වෙන දේපලවලින් ඉහත කී නඩුවේ විත්තිකාරියට තිබෙන අයිතිවාසිකම සහ ප්‍රයෝජනයත් වර්ෂ 1969 ක්වූ සැප්තැම්බර් මස 30 දින පෙරවරු 11.00 ට ඉඩම පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණන්ට යෙදෙන බව මෙයින් දන්වනු ලැබේ. එනම් : රු. 1,705/- ක් (අංක 6472 දරණ උකස්කරය අනුව පොළිය හා මුදලද වේ) හා සෑම රු. 5/-කටම ශත -/10 බැගින් වූ පවුන්ඩේජ් මුදලක්ද අයකර ගැනීම සඳහා:

1. ඌව පළාතේ බදුලු දිස්ත්‍රික්කයේ යටිකිඳ කොට්ඨාශයේ (දූනට පස්සර කොට්ඨාශය යනුවෙන් හැඳින්වෙන) පස්සර කෝරළේ දෙහිකිඳගම

සතිපතා නිකුත්වන ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා එවනු ලබන දන්වීම් පිළිබඳ

### විශේෂ නිවේදනයයි

ඉදිරියට පළවන සාමාන්‍ය සතිපතා ගැසට් පත්‍රවල පළකිරීම සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති විසින් දන්වීම් බාරගන්නා අන්තිම වේලාවන් සහ පළකිරීමේ දින දක්වෙන, මෙම ගැසට් පත්‍රයේ සෑම කොටසකම කෙළවරෙහි පළකර ඇති විශේෂ නිවේදනය කෙරෙහි සියළුදෙනාගේ අවධානය යොමු කෙරේ. යථෝක්ත නිවේදනයේ සඳහන් නියමිත වේලාවන්ට පසුව මෙහි ලැබෙන සියළුම දන්වීම් ඒවා එවන ලද අය වෙත ආපසු එවනු ලැබේ.

1968 දෙසැම්බර් මස 20 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය,
කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
වැඩබලන ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති

පිහිටි අමුණුමුල්ලේ අරාවේ හේන නැමැති කුරක්කන් කුරුණියක පමණ වපසරිය ඇති ඉඩමට මායිම් : උතුරට ඇල, නැගෙනහිරට මෙම ඉඩමේ ඉතිරි කොටස වෙන්වන මායිම, දකුණට ගම්සභා පාර සහ බස්නාහිරට හුදුඅප්පුගේ ඉඩම. මෙම සතර මායිම් තුළ පිහිටි ඉඩම සහ ගොඩනැගිල්ල සහ වගාවන්ද සැම සියළුදේත්ද වේ.

2. ඌව පළාතේ බදුලු දිස්ත්‍රික්කයේ යටිකිඳ කොට්ඨාශයේ (දැනට පස්සර කොට්ඨාශය යනුවෙන් හැඳින්වෙන) පස්සර කෝරළේ දෙහිකිඳගම පිහිටි කොරතුවක්කුඹුර නැමැති කුරක්කන් කුරුණි තුනක පමණ වපසරිය ඇති ඉඩමට මායිම් : උතුරට දමුණුගහ කුඹුරේ බඩල, නැගෙනහිරට සහ දකුණට මෙම ඉඩමේ ඉතිරි කොටස වෙන්වන ඉම නියර, බස්නාහිරට ඇල. මෙම සතර මායිම් තුළ පිහිටි ඉඩම සහ ගොඩනැගිල්ල ද වගාවන් හා සැම සියළු දේත්ද වේ.

අ. තෙ. සිවලිංගම්,
ඌව පිස්කල් වෙනුවට.

1969 අගෝස්තු මස 16 දින,
බදුල්ලේ පිස්කල් කාර්යාලයේ දීය.

8–1408

# ගැසට් පත්‍රය පළකිරීම පිළිබඳව වැදගත් නිවේදනයයි

සතිපතා මුද්‍රණය වන ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය සාමාන්‍යයෙන් සිකුරාද දිනවල පළකරනු ලැබේ. සිකුරාද දිනයක් ආණ්ඩුවේ නිවාඩු දිනයක් වූ විට එම සිකුරාද දිනයට ප්‍රථම වැඩකරන දිනයේ ගැසට් පත්‍රය පළ කරනු ලැබේ. ඒ අනුව ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා නිවේදන බාරගන්නා අන්තිම දිනය ද එම සතියේ ඇතිවන ප්‍රසිද්ධ නිවාඩු දින ගණන අනුව වෙනස් වනු ඇත.

ඒ ඒ ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දින සහ වේලාවන් පහත පළකර ඇති උප ලේඛනයේ දක්වේ. පහත සඳහන් නියමිත වේලාවන්ට පසුව ලැබෙන සියළුම දැන්වීම් එය එවූ අය වෙත තැපෑලෙන් ආපසු එවනු ලැබේ. ඊළඟ ගැසට් පත්‍රයේ එය පළ කළ යුතු නම් අවශ්‍ය සංශෝධනයන් කර ආපසු එවිය යුතුය. රජයේ මුද්‍රණාලය වෙත තැපැල් මගින් එවන දැන්වීම් අප්‍රමාදව එහි ලැබීමට සෑහෙන වේලාවක් දී තැපැල් කිරීමෙන් උවමනා ගැසට් පත්‍රයට දැන්වීම් ඇතුළත් වනවාත් හැර එය සියළුදෙනාගේ පහසුවට ද හේතුවන බව සලකන්න.

ආණ්ඩුවේ ගැසට් පත්‍රය සඳහා ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති දයක මුදල් භාර නොගනී. සියළුම දයක මුදල් **කොළඹ මහලේකම් කාර්‍යාල ගොඩනැගිල්ලේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්‍යාංශයේ අධිකාරී වෙත කෙළින්ම ගෙවිය යුතුය.**

උපලේඛනය

**1969**

| මාසය | පළකිරීමේ දිනය | ගැසට් පත්‍රයේ පළකිරීම සඳහා දැන්වීම් භාරගන්නා අන්තිම දිනය හා වේලාව | |
|---|---|---|---|
| ජූනි | 69.6. 6 සිකුරාද | 69. 5.30 සිකුරාද | දවල් 12.00 |
| | 69.6.13 සිකුරාද | 69. 6. 6 සිකුරාද | දවල් 12.00 |
| | 69.6.20 සිකුරාද | 69. 6.13 සිකුරාද | දවල් 12.00 |
| | 69.6.27 සිකුරාද | 69. 6.20 සිකුරාද | ප.ව. 3.30 |
| ජූලි | 69. 7. 4 සිකුරාද | 69. 6.27 සිකුරාද | ප.ව. 3.30 |
| | 69. 7.11 සිකුරාද | 69. 7. 4 සිකුරාද | ප.ව. 3.30 |
| | 69. 7.18 සිකුරාද | 69. 7.11 සිකුරාද | ප.ව. 3.30 |
| | 69. 7.25 සිකුරාද | 69. 7.18 සිකුරාද | ප.ව. 3.30 |
| අගෝස්තු | 69. 8. 1 සිකුරාද | 69. 7.25 සිකුරාද | ප.ව. 3.30 |
| | 69. 8. 8 සිකුරාද | 69. 8. 1 සිකුරාද | ප.ව. 3.30 |
| | 69. 8.15 සිකුරාද | 69. 8. 8 සිකුරාද | ප.ව. 3.30 |
| | 69. 8.22 සිකුරාද | 69. 8.15 සිකුරාද | ප.ව. 3.30 |
| | 69. 8.29 සිකුරාද | 69. 8.22 සිකුරාද | ප.ව. 3.30 |
| සැප්තැම්බර් | 69. 9. 5 සිකුරාද | 69. 8.29 සිකුරාද | ප.ව. 3.30 |
| | 69. 9.12 සිකුරාද | 69. 9. 5 සිකුරාද | ප.ව. 3.30 |
| | 69. 9.19 සිකුරාද | 69. 9.12 සිකුරාද | ප.ව. 3.30 |
| | 69. 9.26 සිකුරාද | 69. 9.19 සිකුරාද | ප.ව. 3.30 |
| ඔක්තෝබර් | 69.10. 2 බ්‍රහස්පතින්ද | 69. 9.26 සිකුරාද | ප.ව. 3.30 |
| | 69.10. 9 බ්‍රහස්පතින්ද | 69.10. 2 බ්‍රහස්පතින්ද | දවල් 12.00 |
| | 69.10.17 සිකුරාද | 69.10. 9 බ්‍රහස්පතින්ද | දවල් 12.00 |
| | 69.10.24 සිකුරාද | 69.10.17 සිකුරාද | දවල් 12.00 |
| | 69.10.31 සිකුරාද | 69.10.24 සිකුරාද | දවල් 12.00 |
| නොවැම්බර් | 69.11. 7 සිකුරාද | 69.10.31 සිකුරාද | දවල් 12.00 |
| | 69.11.14 සිකුරාද | 69.11. 6 බ්‍රහස්පතින්ද | දවල් 12.00 |
| | 69.11.21 සිකුරාද | 69.11.14 සිකුරාද | ප.ව. 3.30 |
| | 69.11.28 සිකුරාද | 69.11.21 සිකුරාද | ප.ව. 3.30 |
| දෙසැම්බර් | 69.12. 5 සිකුරාද | 69.11.28 සිකුරාද | ප.ව. 3.30 |
| | 69.12.12 සිකුරාද | 69.12. 4 බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |
| | 69.12.19 සිකුරාද | 69.12.12 සිකුරාද | ප.ව. 3.30 |
| | 69.12.26 සිකුරාද | 69.12.18 බ්‍රහස්පතින්ද | ප.ව. 3.30 |

1969 ජූනි මස 13 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණාලය, කොළඹ.

එල්. ඩබ්ලිව්. පී. පීරිස්,
වැඩබලන ආණ්ඩුවේ මුද්‍රණාලයාධිපති.

ලංකාණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි